# දුම්රිය තාක්ෂණ හා මෙහෙයුම් සේවා සංගමය
# புகையிரதத் தொழிநுட்பவியல் மற்றும் இயக்க சேவை சங்கம்
# RAILWAY TECHNOLOGICAL & OPERATING SERVICE UNION

ලි. ප. අංකය : 8565

294/7, අශෝකාරාම පාර, ඉහළ බෝමිරිය, කඩුවෙල.

| ගරු ප්‍රධාන සභාපති | ගරු ප්‍රධාන ලේකම් | ගරු ප්‍රධාන භාණ්ඩාගාරික |
|---|---|---|
| **ආර්. කේ. එච්. සංදය කුමාර** | **චන්ද්‍රසේන කේ. බණ්ඩාර** | **ආර්. එම්. ජී. ජයතිලක** |
| දුර. 071 4402753 | දුර. 071 4421482 | දුර. 071 8242900 |


2026.09.14

ලේකම්,
දුම්රිය ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය,

**<u>2026.0916 සහ 17 දෙදින ක්‍රියාත්මක කිරීමට නියමිත ඒකාබද්ධ ක්‍රියාමාර්ගය සමග බද්ධවීමට තීරණය කිරීම</u>**

වසර 32 ක සේවා ඉතිහාසයේදී හෝ ඉන් වසර 26 ක් වූ අප සංගමයේ අඛණ්ඩ වෘත්තීය සමිති පසුබිම තුල හෝ වත්මන් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා තරම් අසාර්ථක සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුරට ඔබින නොවන නිලධාරියෙකු මෙම තනතුර දරා නොමැති බව අපගේ විශ්වාසයයි. දුම්රිය සේවාවේ පැවැත්ම රඳා පවතින සහ අත්තනෝමතිකව හා ඒකපාර්ශ්විකව වෙනස් කිරීමටද නොහැකි අන පනත් ආදියෙහි ඇතුලත් නීතිගත හා සම්මත ක්‍රමවේද නොසලකා මෙහෙයුම් රාජකාරී කටයුත්තකදී තමාගේ තීරණය ඒකමතිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් දුම්රිය සාමාන්‍යාධිකාරී තනතුරේ රාජකාරියට ප්‍රවේශය ලබාගත් මෙතුමා දුම්රියේ අභිවෘද්ධිය කෙසේ වුවත් එය තිබූ මට්ටමින් පවත්වාගෙන යාමට හෝ අසමත්, අධ්‍යක්ෂයෙකු බවට පත්වී ඇත.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කටයුතු නව තාක්ෂණය ඔස්සේ ක්‍රමවත් කලේය යනුවෙන් වූ මෙතුමාගේ පූර්ව රාජකාරී දක්ෂතාවයක් පිළිබඳව අසා තිබූ අප දුම්රිය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ප්‍රමාදවීමේ ගැටළුවටද එවන් විසඳුමක් ලබාදෙනු ඇතැයි විශ්වාස කළෙමු. එහෙත් වර්තමානයේදී එම දෙපාර්තමේන්තුව තුලදී දික්ගැස්සෙන ආකාරය අනුව එකී පෙර ආරංචිය ගැන නැවත මෙනෙහි කරන්නටද සිදුවී ඇත. එසේ තිබියදී දීර්ඝ කාලයක සිට දුම්රිය සේවකයින්ද දැඩි පීඩාවට පත්කරන විශ්‍රාම ලිපිගොනු කටයුතු ප්‍රමාදවීමේ ගැටළුව හෝ නිරකරණය කරදීමට මෙතුමා මේ දක්වා අසමත්වීම දුම්රිය සාමාන්‍යාධිකාරී තනතුර සඳහා පවතින අසාර්ථකත්වය මැනවින් තහවුරු කරන්නකි.

පරිපාලනය හෝ වෙනත් ඒකාංගික දක්ෂතාවයක් පමණක් දක්වන්නෙකු දුම්රිය වැනි සුවිශේෂී ඉංජිනේරුමය දෙපාර්තමේන්තුවක ප්‍රධාන තනතුර සඳහා නොගැලපෙන බව සක්සුදක් සේ පැහැදිලි කරුණක් වන අතර මෙතුමා විසින් එය මනාව ඔප්පු කර ඇත. කෙසේ වුවද තවදුරටත් අත්හදා බැලීම් අවස්ථා හෝ පරීක්ෂණ කාලයන් ලබාදීම තුලින් මෙලෙස අභාවයට යමින් පවතින දුම්රිය සේවාව යළි ගොඩගත නොහැකි තත්වයට පත්වනු ඇත.

එසේ වීමට පෙර මෙතුමා සම්බන්ධයෙන් ඔබ සංධානය ගෙන ඇති තීරණය ඉතා අගය කරමින් ඒ තුලින් ගරු ජනාධිපතිතුමාගේ සුවිශේෂී අවධානය යොමු කරවීම සඳහා අප සංගමයද මෙම ක්‍රියා මාර්ගයට සක්‍රියව බද්ධ වන බව දන්වා සිටිනු කැමැත්තෙමු.

ස්තූතියි.
මෙයට - විශ්වාසී,

.........................................
ප්‍රධාන ලේකම්

<u>පිටපත්</u> : 1. ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා
2. ගරු ප්‍රවාහන අමාත්‍ය බිමල් රත්නායක මැතිතුමා
3. ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මැතිතුමා
4. ගරු ප්‍රවාහන ලේකම්තුමා